# බුද්ධ ධර්මය

## 2 ශ්‍රේණිය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට
www.edupub.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

සියලු හිමිකම් ඇවිරිණි

ප්‍රථම මුද්‍රණය :- 2016
දෙවන මුද්‍රණය :- 2017
තෙවන මුද්‍රණය :- 2018
සිව්වන මුද්‍රණය :- 2019
පස්වන මුද්‍රණය :- 2020

ISBN 978-955-25-0223-1

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
කැලණිය, ගෝනවල, පට්ටිවිල, පන්සල පාර, අංක 30/1 දරන ස්ථානයෙහි පිහිටි
නිම්තරා ප්‍රින්ටර්ස් ආයතනයේ
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදි.

Published by - Educational Publications Department
Printed by - Nimthara printers

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

## අධ්‍යාපන අමාත්‍යාංශයේ බෞද්ධ උපදේශක මණ්ඩලය විසින් අනුමත කරන ලද ගුරු වන්දනා ගාථාව සහ අධිෂ්ඨාන පද්‍යය

### ගුරු වන්දනා ගාථාව

ඕවාද සිප්ප දානේන
සික්ඛාපේති මමං ගරු
සගාරවේන චිත්තේන
අහං වන්දාමි තං ගරුං

ඔවා සිප් දීමෙන
මා හික්මවන පේමෙන
ඇදුරු හද බැතියෙන
වඳිමි ගරු සිත පෙරටු කරමින

### පාසල් උදෑසන රැස්වීම අවසානයේ කෙරෙන අධිෂ්ඨානය

තෙරුවන පුදා සිහි කර මාපිය දෙදෙන
ගුරු සිත දිනා ඔප කර ගෙන ගුණ නුවණ
කරමින සබා විදුහල් මෑණිගෙ සිහින
සුරකිමි සදා මගෙ රට ජාතිය සසුන

රචක: පූජ්‍ය ගන්තුනේ අස්සජි හිමි

## පෙරවදන

මනුගුණදම් සුරකින්නට නිති කැපවුණු කුසලතා පිරි මනුෂ්‍ය වර්ගයාට මේ ලෝකය වඩාත් සොඳුරු බිමක් බවට පත් කළ හැකි ය. ඒ සඳහා රටක අධ්‍යාපනය නිරතුරුවම බලසම්පන්න කරගතයුතු වන්නේ අනාගත වැඩලොව පිළිබඳව ද මනා අවදියෙන් සිටිමිනි. දිනෙන් දින විශ්ව ගම්මානය වෙත එක්වන සාරවත් නව දැනුම අපේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සමඟ මුසුකර ගැනීම අනිවාර්යයෙන් සිදුවිය යුතු අතරම අපගේ යහගුණදම් ද ඒ හා ඒකාත්මික කරගන්නට අමතක නොකළ යුතු ය. මෙම සාධනීය ගුණාංග රැකගනිමින් වඩාත් යහපත් සිසු පරපුරක් නිර්මාණය කිරීමේ උත්කෘෂ්ට මෙහෙවරට අවැසි ගුණාත්මක ඉගෙනුම් ආධාරක සම්පාදනය කිරීම අප දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ පරමාර්ථය බව අවධාරණය කරමි.

නේක විසිතුරු සිත්තම් හා අකුරුවලින් සපිරි මේ පෙළපොත් අනාගත ලොවට මඟ එළි දල්වන ප්‍රදීපස්තම්භ බඳු ය. ඔබ පාසල් බිමෙන් සමුගත් දිනක වුව, තුටින් සිහි කළ හැකි මිහිරි මතක, මේ පාඩම් පොත් පිටු අතර රැඳී තිබෙනු නිසැක ය. ගුරු තරුවල නොමඳ ආලෝකය ලබා ගනිමින් ඔබ මේ දැනුම හා වින්දනය කැටිකළ අනගි ත්‍යාගයෙන් නිසි පල නෙළා ගත යුත්තේ තව තවත් දැනුම් අවකාශ වෙත යුහුසුලුව පියමනිමිනි. රජය පෙළපොත් වෙනුවෙන් වැය කළ අප්‍රමාණ වූ ධනස්කන්ධයට අමිල අගයක් ලබා දිය හැක්කේ පාසල් සිසු දරු දැරියන් වූ ඔබට පමණි. දිවිය වෙත හඹා එන අනේක බාධක දිරියෙන් ජයගෙන, හෙට ලොව සුපුෂ්පිත කරවන්නට දැයේ දරුදැරියන්ට හැකිවේවායි අප්‍රමාණ ස්නේහයෙන් ආශීර්වාද කරන්නෙමි.

පෙළපොත් සම්පාදන ක්‍රියාවලිය වෙනුවෙන් මනා කැපවීමකින් සම්පත්දායකත්වය සැපයූ ලේඛක, සංස්කාරක හා ඇගයුම් මණ්ඩල සාමාජික පිරිවරටත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සැමටත් මාගේ හදපිරි ස්තුතිය පිරිනමමි.

**පී. එන්. අයිලප්පෙරුම**

අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ඉසුරුපාය

බත්තරමුල්ල

2020.06.26

**නියාමනය හා අධීක්ෂණය :**

**පී. එන්. අයිලප්පෙරුම**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**මෙහෙයවීම :**

**ඩබ්ලිව්. ඒ. නිර්මලා පියසීලි**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**සම්බන්ධීකරණය :**

**ඩී.එම්. ජයන්ත පුෂ්පකුමාර**
නියෝජ්‍ය කොමසාරිස් (පාලන)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**උපදේශක මණ්ඩලය :**

1. **අතිපූජ්‍ය ගන්තුනේ අස්සජි මහානායක ස්වාමීන් වහන්සේ**
   විශ්‍රාමික කථිකාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

2. **එස්.බී.එම්. නිමල් ධර්මසිරි**
   අධ්‍යක්ෂ, ආගමික හා සාරධර්ම අංශය, අධ්‍යාපන අමාත්‍යාංශය

3. **ගුණසේන මහතන්ත්‍රිගේ**
   විශ්‍රාමික නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය

4. **ලීලා බලදොර**
   විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, හාපිටිගම් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය

**සිංහල භාෂා සංස්කරණය :**

**රංජිත් ඉලුප්පිටිය**
අධ්‍යක්ෂ (හිටපු)
ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය, අධ්‍යාපන අමාත්‍යාංශය

**සංස්කාරක මණ්ඩලය :**

1. **පූජ්‍ය කොටනෙළුවේ පුඤ්ඤානන්ද ස්වාමීන් වහන්සේ**
   සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
   අධ්‍යාපන අමාත්‍යාංශය

2. **පූජ්‍ය උඩුගම සුදස්සී ස්වාමීන් වහන්සේ**
   දෙපාර්තමේන්තු ප්‍රධානි, ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
   ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම

**ලේඛක මණ්ඩලය :**

1. **පූජ්‍ය දමන සුගතධම්ම ස්වාමීන් වහන්සේ**
   කථිකාචාර්ය, හාපිටිගම් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය

2. **ආර්.එච්. දීපිකා පෙරේරා**
   ගුරු සේවය, බප/ජය ධර්මාශෝක කනිෂ්ඨ විද්‍යාලය

3. **චන්ද්‍රිකා අඹේපිටිය**
   විශ්‍රාමික උපගුරු, කො/ දේවි බාලිකා විද්‍යාලය

**චිත්‍ර සහ පිටකවර නිර්මාණය :**

**ඩබ්.පී. සුසිල් ජයශාන්ත පෙරේරා**

**පරිගණකගත කිරීම සහ පිටු නිර්මාණය :**

**පී. ඒ. ශයිනි ඉමල්ෂා විජේවර්ධන**

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# පටුන


| | පිටු අංකය |
|---|---|
| 1. නිති පන්සිල් රකිමු | 1 |
| 2. පින්බිමට යන බොදු දරුවෝ | 4 |
| 3. හොඳ දරුවෝ වෙමු | 10 |
| 4. මහාමායා දේවිය දුටු සිහිනය | 16 |
| 5. බෝසත් උපත | 18 |
| 6. පිය රජුගේ පළමු වැඳීම | 21 |
| 7. කුමරුට නම් තැබීම | 23 |
| 8. මට්ටකුණ්ඩලී දෙව් පුත් | 25 |
| 9. සතුන්ට කරුණාව දක්වමු | 28 |
| 10. ගමේ විහාරෙට පෙරහැර එනවා | 30 |
| 11. බොදු ගී | 32 |
| 12. අපේ පෙරහැරට මල් ගසක් හදමු | 34 |
| 13. පින්තාලියක් හදමු | 36 |
| 14. අනාථපිණ්ඩික සිටුතුමා | 39 |

| | පිටු අංකය |
|---|---|
| 15. අනුබුදු මිහිඳු හිමි | 40 |
| 16. සාලිකේදාර ජාතකය | 42 |
| 17. අපේ ගෙදර පින්කමට සූදානම් | 45 |
| 18. පින්කම දා අපේ ගෙදර | 49 |
| 19. කම්මැළි නැති ළමයි | 53 |
| 20. අපි තාත්තාට අම්මාට උදවු කරමු | 56 |
| 21. කනට මිහිරි වචන | 59 |
| 22. ආදරයෙන් පරිසරය රැක ගනිමු | 62 |
| 23. අන් සන්තකයක් ගන්න එපා | 65 |
| 24. හොඳ ගුණදම් පුරුදු වෙමු | 69 |
| 25. පිළිවෙළකට දවස ගෙවමු | 71 |
| 26. සිල් ගනිමු පින් පුරමු | 74 |
| 27. මෙත් සිත පතුරමු | 76 |
| 28. යහපත් මිතුරු ඇසුර | 78 |
| 29. නීරෝගී වෙමු | 81 |
| 30. ථූපාරාම දාගැබ නමදිමු | 85 |
| 31. සමාධි පිළිම වහන්සේ | 87 |

# 1 නිති පන්සිල් රකිමු

මුදිතා උදෙන් ම අවදි වී මුහුණ සෝදා ගත්තා;

පිරිසිදු ඇඳුමක් ඇඳ හිස පීරා ගත්තා;

දැත් සෝදා ගෙන වත්තට ගොස් වට්ටියට මල් නෙළා ගත්තා.



මුදිතා මල් ධෝවනය කළා.

තාත්තා බුදු හාමුදුරුවන් ළඟ පහනත්, හඳුන්කූරුත් පත්තු කළා.

අම්මා මල් වට්ටියත්, පැන් වීදුරුවත් තැන්පත් කළා.

සියලු දෙනා ම නමස්කාරය කියා, තිසරණ සහිත පන්සිල් සමාදන් වුණා;



1. පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

2. අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

3. කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

4. මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

5. සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

ගාථා කියා පහන්, සුවඳ දුම්, මල්, පැන්
බුදුරජාණන් වහන්සේට පූජා කළා.



## පුහුණුවට

මම බුදු සරණ යමි
සිරි සදහම් සරණ යමි
මහ සඟ සරණ යමි
උතුම් තෙරුවන් සදා නමදිමි

මම සතුන් නොමරමි
සොරකම් කිසිත් නොකරමි
වැරැදි වැඩ නොකරමි
බොරු බසින් රහමෙරින් වැළකෙමි

# 2 පින්බිමට යන බොදු දරුවෝ

අත්තම්මා :- දුවේ, පුතේ, අපි පන්සලට
යන විට සංවර සුදු ඇඳුමක් ඇඳලා
යන්න ඕනේ.



සීයා :- ඒක ඇත්ත.

පන්සල කියන්නේ පින් බිමක් පුතේ.

අපි පන්සලේ දී ශබ්ද නගා කතා කරන්නත් හොඳ නෑ.

හඬ නගා හිනා වෙන්නත් හොඳ නෑ.

හොඳ දරුවෝ පන්සලේ දී සංවර ව හැසිරෙන්න ඕනෑ.

## පන්සල් බිමේ දී.



කසුන් :- අත්තම්මේ,
මම බුදු පිළිම වහන්සේ ළඟත්,
බෝධීන් වහන්සේ ළඟත්,
වෙහෙර වහන්සේ ළඟත්
තියෙන මල් ආසන හොඳට පිරිසිදු
කළා.

සුජානි :- මම විහාර මළුව හොඳට ඇමදුවා.
කුණු එකතු කරලා කුණු වළට
ගිහින් දැම්මා.

## වන්දනා කරමු.

සීයා :- අපි පිළිවෙළින් වෙහෙර වහන්සේටත්,
බෝධීන් වහන්සේටත්,
පිළිම වහන්සේටත්
මල්, පහන් පූජා කරමු.

අත්තම්මා :- දැන් අපි කවුරුත් එකතු වෙලා
වන්දනා කරමු.

සීයා :- අපි වන්දනා කරද්දී, වටපිට බලන්න,
කතා කරන්න හොඳ නැහැ.
දොහොත් මුදුනේ තබාගෙන ගාථා
කියන්න ඕනෑ.



## වන්දනාවෙන් පසු.

සීයා :- දූලා පුතාලා හොඳ දරුවෝ.
හොඳට ගාථා කියලා බුදුන් වැන්දා.
කවුරුත් එකට එකතු වෙලා සාධුකාර
දුන්නා.

අත්තම්මා :- අපි වන්දනාවෙන් පස්සේ පාවිච්චි කළ
භාජන අස් කරන්න ඕනෑ.

සංඛ :- අත්තම්මේ මම මල්, පහන්, ගිලන්පස
භාජන අස් කළා.

නාමලී :- මම ඒ භාජන සෝදලා අරන් තිබ්බා.

සීයා :- දූලාට පුතාලාට තෙරුවන් සරණයි.

දරුවෝ :- සීයාටත්, අත්තම්මාටත් තෙරුවන්
සරණයි.

## ක්‍රියාකාරකම



❀ නිවැරැදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

1. පන්සලට අඳින්න ඕනෑ
   (පාට ඇඳුම් / සංවර සුදු ඇඳුම්)

2. විහාර මළුව ඇමදුවේ
   (සුජානි / සංඛ)

3. දොහොත් මුදුන් දී බුදුන් වඳින්න ඕනෑ
   (සීයා / අත්තම්මා) කිවුවා.

4. වන්දනාවෙන් පසු මල්, පහන්, ගිලන්පස භාජන
   අස් කරන්න ඕනෑ (අත්තම්මා / සීයා) කිවුවා.

# 3 හොඳ දරුවෝ වෙමු

සංඛ - සීයේ හෙට දහම් පාසලේ දී මට කතාවක් කරන්න තියෙනවා.

සීයා - මොකක් ගැන ද පුතා?

සංඛ - 'හොඳ ළමයෙක් කරන වැඩ' ගැන.

සීයා - ඒක බොහොම හොඳයි.

සංඛ - සීයේ හොඳ ළමයෙක් කරන දේවල් ගැන මට කියලා දෙන්න පුළුවන් ද?

සීයා - එහෙනම් පුතා හොඳට අහගන්න.

හොඳ ළමයා නිතර ම තෙරුවන් ගුණ සිහි කරනවා.
පන්සලට ගියා ම හාමුදුරුවන්ට පසඟ පිහිටුවා වඳිනවා.

ඒ වාගේ ම හාමුදුරුවන්ට සැදැහැ සිතින් සලකන්නත් ඕනෑ.



හාමුදුරුවෝ දෙන අවවාද අනුශාසනා පිළිගන්නවා.



හාමුදුරුවෝ අසුන් ගන්නා ආසනවල ගිහි අය වාඩි වෙන්නේ නැහැ.

හොඳ ළමයා දෙමවුපියන්, ගුරුවරුන් කියන දේ අහලා හොඳට ඉගෙන ගන්නවා.

මවුපියන්ටත්, ගුරුවරුන්ටත්, වැඩිහිටියන්ටත් ගෞරවයෙන් සලකනවා.

යහළුවකුට කරදරයක් වුණා ම ඒ ගැන සොයා බලා උදවු කරනවා.



අසරණ කෙනෙක් දුටුවා ම උදවු කරනවා.



අපේ රටේ වෙනත් ආගම්වලටත් හොඳ
ළමයා ගරු කරනවා.

වෙනත් ආගමක පූජකවරයකු දුටු විටත් ගරු
කරනවා.

සංඛ - සීයා කියාපු දේවලින් මට දැන් හොඳ
කතාවක් කරන්න පුළුවන්.
සීයාට බොහෝ ම පින්.

සීයා - කතා කරලා විතරක් මදි.
මේ කරුණු තේරුම් අරගෙන පුතාත්
හොඳ දරුවෙක් වෙන්න.

සංඛ - හොඳයි සීයේ.



## ක්‍රියාකාරකම

✿ මෙම වාක්‍ය හරි ද? වැරදි ද?
නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. හාමුදුරුවන්ට අපි පසඟ පිහිටුවා වඳිනවා.
   (හරි / වැරදි)

2. හාමුදුරුවන්ගේ ආසනවල අපි වාඩි වීම හොඳ නැහැ.
   (හරි / වැරදි)

3. කෙනෙකුට උදවු කිරීම හොඳ නැහැ.
   (හරි / වැරදි)

4. දෙමවුපියන්ට, ගුරුවරුන්ට ගරු කරන්න ඕනෑ.
   (හරි / වැරදි)

5. අනෙක් ආගම්වලටත් අපි ගරු කරනවා.
   (හරි / වැරදි)

# 4 මහාමායා දේවිය දුටු සිහිනය



කපිලවස්තු නුවර සුද්ධෝදන රජුගේ
අග බිසොව මහාමායා දේවියයි.
ඇය
හරි ම පින්වත්, සිල්වත්,
කරුණාවන්ත කෙනෙක්.


එදා ඇසළ පෝය දවසක්.
සිල් සමාදන් ව
රාත්‍රි නින්දට ගිය මහාමායා දේවිය
ලස්සන සිහිනයක් දැක්කා.

දෙවිවරු සතර දෙනෙක්
දේවිය නිදා සිටි යහන ඔසවාගෙන
හිමාල වනයට ගියා;
මල් පිපුණු සල් ගසක් යට
දේවිය තැබුවා.
සුරංගනාවියෝ සතර දෙනෙක්
දේවිය අනෝතත්ත විලෙන් නහවා
සුවඳ ගල්වා, දිව සළු අන්දවා
යහනක නිදි කළා.

ඒ වේලාවේ සුදු නෙළුම් මලක් සොඬින් ගත්
සුදු ඇත් පැටවෙක්
දකුණු ඇලයෙන් දේවියගේ
කුසට ඇතුළු වුණා.

මේ සිහිනය ඇසූ බමුණු පඬිවරු
දේවියට පින්වත් පුතකු උපදින බව කිවුවා.

# 5 බෝසත් උපත



කාලය ගෙවුණා
දස මස පිරුණා
මා පිය දකුමට
ආසා හිතුණා.

මායා දේවිය
දෙව්දහ නුවරට
මහ පෙරහැරකින්
පිටත් වුණා.


එදා වෙසක් පෝය දවසක්.
ලුම්බිණි සල් උයන මලින් පිරී තිබුණා.
උයන පුරා සතුටින් ඇවිද්ද මහාමායා දේවියට
අපහසුවක් දැනුණා.

සේවිකාවෝ දේවිය වට කර තිර රෙදි ඇද්දා.
පින්වත් මහබෝසත් කුමරු ඉපදුණා.
ඒ මොහොතේ අසිරිමත් සිදුවීමක් වුණා.

නෙළුම් මල් හතක් පිපුණා.
කුමරු ඒ මත ඇවිද්දා.
ඇඟිල්ලක් ඔසවා මෙසේ කීවා;

"අග්ගෝහමස්මි ලෝකස්ස
ජෙට්ඨෝහමස්මි ලෝකස්ස
සෙට්ඨෝහමස්මි ලෝකස්ස
අයමන්තිමා ජාති
නත්ථිදානි පුනබ්භවෝ"

දෙවිවරු සාධුකාර දුන්නා.
පිරිවර ප්‍රීති ඝෝෂා කළා.



## පුහුණුවට

ලොවට ම අග වෙමි
ලොවට ම දෙටු වෙමි
ලොවට ම සෙට වෙමි
යළි නොම උපදිමි

# 6 පිය රජුගේ පළමු වැඳීම




සුද්ධෝදන මහ රජුගේ ගුරුවරයා වූයේ
කාලදේවල තාපසතුමා ය.
එතුමා කුමරු බලන්න රජ මාලිගාවට පැමිණියා.
"මහ රජුනි, ඔබගේ පින්වත් පුත් කුමරු දකින්නට
මම කැමැතියි,"
තාපසතුමා කිවුවා.

පුත් කුමරු දෝතට ගත් රජතුමා
ගුරුවරයා ඉදිරියට පැමිණියා.
"පුතේ තාපසතුමාට වඳින්න,"
රජතුමා පුත් කුමරු තවුසා වෙතට ළං කළා.

කුමරුගේ දෙපතුල
තාපසතුමාගේ ජටාවේ වැදුණා.
තාපසතුමා පුදුම වුණා.
පුත් කුමරුගේ පින් මහිමය දැක
එක් වර ම නැගිට්ටා.
කුමරුට වැන්දා.
මෙය දුටු පිය රජතුමා ද කුමරුට වැන්දා.
එය පිය රජුගේ පළමු වැඳීම ය.

# 7 කුමරුට නම් තැබීම

බෝසත් කුමරු ඉපදී දින පහක් ගත වුණා.
කුමරුට නම් තබන දිනය එළඹුණා.
රජතුමා උගත් බමුණන් 108 දෙනෙක්
මාලිගාවට කැඳෙව්වා.



බමුණු පඬිවරු කුමරු දෙස හොඳින් බැලුවා;
පින්වත් පුත් කුමරකු බව දැන ගත්තා;
ගිහිගෙයි විසුවොත්
සක්විති රජ වන බවත්,
පැවිදි වුවොත්
බුදු වන බවත් පැවසුවා.

ලොවට ම මහත් අර්ථයක් සිදු කිරීම
පිණිස උපන් බැවින්
කුමරුට "**සිද්ධාර්ථ**" යැයි නම් තැබුවා.


# 8 මට්ටකුණ්ඩලී දෙව් පුත්

අදින්නපුබ්බක සිටියේ සැවැත් නුවර.
ඔහු ධනවත් බමුණෙක්;
ඒත් හරි ම ලෝබයි.
ඔහුට පුතෙක් හිටියා.

පියා විසින්
රත්තරන් කෑලි දෙකක් තළා
පුතාගේ කන්වල පැලඳුවා.
ඒවා කිසිම හැඩයක් නැති ආභරණ.
ඒ නිසා පුතා මට්ටකුණ්ඩලී
නමින් ප්‍රසිද්ධ වුණා.

පියාගේ ලෝබකම නිසා ම,
පුතාට සුදුසු ආහාර ලැබුණේ නෑ.
මට්ටකුණ්ඩලී ලෙඩ වුණා.

වෙද මහතෙක් ගෙන්වා පුතාට
ප්‍රතිකාරයක් කළෙත් නැහැ.
ඒ වෙනුවට පියාම ගස්වල කොළ, පොතු තළා
මට්ටකුණ්ඩලීට පෙව්වා.
එයින් රෝගය තවත් දරුණු වුණා.



මරණාසන්න වූ මට්ටකුණ්ඩලී
ගෙයින් පිටත පිලේ තැබුවා.


බුදු හාමුදුරුවෝ මහා කරුණාවෙන්
ලෝකය දෙස බැලුවා.

උන් වහන්සේට
දෙමාපියන්ගේ පිහිටක් නැති
අසරණ මට්ටකුණ්ඩලී
දිවැසින් පෙනුණා.
මට්ටකුණ්ඩලීගේ නිවස ළඟට වැඩියා.
බුදුරැස් විහිදෙව්වා.
මට්ටකුණ්ඩලී හැරී බැලුවා.
බුදු හාමුදුරුවන්ගේ ලස්සන
දැක සාධුකාර දුන්නා.
සතුටින් මරණයට පත් වුණා. මට්ටකුණ්ඩලී
දෙව් පුතෙක් වී දිව්‍යලෝකේ ඉපදුණා.



# 9 සතුන්ට කරුණාව දක්වමු

බුදු හාමුදුරුවෝ
සතුන්ටත් කරුණාව දැක්වූවා.




දවසක් බුදු හාමුදුරුවෝ
පාරේ වඩින අතර
ළමයි ටිකක් එකතු වෙලා
ගල්වලින් පොලුවලින් ගැරඬියකුට
ගහනවා දැක්කා.

"දරුවනි,
ඇයි ඔය සතාට ගහන්නේ?"
බුදු හාමුදුරුවෝ
ළමයින්ගෙන් ඇහුවා.

"ස්වාමීනී,
අපි හදන්නේ මේ
සර්පයා මරන්න."

"ඔය දරුවෝ කැමැති ද
කවුරු හරි ඔය දරුවන්ට
ගල්වලින් පොලුවලින් පහර දෙනවාට?"
"අපෝ ! නෑ, අපි කැමැති නෑ.
එතකොට අපට රිදෙනවා,
තුවාල වෙනවා."
ළමයි කිවුවා.

"දරුවනේ,
හිංසා කරනකොට අපට වගේ ම
සතුන්ටත් තුවාල වෙනවා,
රිදෙනවා.
අපි වගේ ම සතුනුත්
හිංසාවට අකැමැතියි."



"බුදු හාමුදුරුවනේ,
අපි ආයෙ කවදාවත්
සතුන්ට හිංසා කරන්නේ නැහැ,"
ළමයි පොරොන්දු වුණා.

# 10 ගමේ විහාරෙට පෙරහැර එනවා



කස හඬ පුපුරා
ගිනි කෙළි කරකා
මග ඉඩ සලසා
පෙරහැර එනවා

හේවිසි නාදය
නංවා දස අත
පෙරහැර එන බව
ගමට කියනවා

සැරසූ මල් ගස්
අරගෙන සේසත්
දෝතින් කොඩි ගත්
ළමයින් එනවා

ළමා සාරි ඇඳ
ගැහැනු ළමා පෙළ
සාධු කියාගෙන
පෙරහැරෙ එනවා

ඇත් පැටවෙකු ලෙස
සැරසුණු දරු කැල
ළමා පෙරහැරේ
සිරිය වඩනවා

කළගෙඩි සෙල්ලම්
උඩරට වන්නම්
තාලෙට නටමින්
නැට්ටුවෝ එනවා

සාධු නාද මැද
සැවොම සතුටු කර
ගමේ විහාරෙට
පෙරහැර එනවා



# 11 බොදු ගී



බුදු සාදු බුදු සාදු
සඳුන් ගසක් වෙන්නම්
මම සමන් වැලක් වෙන්නම්//

ඔබගේ පාමුල සමන් වැලක් වී//
සුවඳ මලින් සැරසෙන්නම්//

බුදු සාදු බුදු සාදු
සඳුන් ගසක් වෙන්නම්
මම සමන් වැලක් වෙන්නම්

ඔබ වැඩි අරණේ සඳුන් ගසක් වී//
සිසිල සෙවණ රඳවන්නම්//

බුදු සාදු බුදු සාදු
නෙළුම් මලක් වෙන්නම්
මම නෙළුම් මලක් වෙන්නම්

ඔබගේ පියවර මැනුම් ඉදිරියේ//
මුදු පාපිස්නක් වෙන්නම්//

බුදු සාදු බුදු සාදු
සඳුන් ගසක් වෙන්නම්
මම සමන් වැලක් වෙන්නම්

බුදු සාදු බුදු සාදු
නෙළුම් මලක් වෙන්නම්
මම නෙළුම් මලක් වෙන්නම්

පද රචනය : අසෝක කොළඹගේ මහතා
සංගීතය : ඩී.ඩී. ඩැනී මහතා
ගායනය : විශාරද නන්දා මාලනී මහත්මිය

# 12 අපේ පෙරහැරට මල් ගසක් හදමු

අවශ්‍ය ද්‍රව්‍යඃ-

✵ අඩි හතරක් පමණ උස ලී මිටක් (එක පැත්තක් උල් කරන ලද)

✵ ශුද්ධ කරන ලද ඉරටු 20ක්

✵ කෙසෙල් බඩ කැබැල්ලක් හෝ පැපොල් ගෙඩියක්

✵ අරලිය මල් හෝ සව් කඩදාසිවලින් කපාගත් තීරු හා මල් පෙති (පාට දෙකකින්)

✵ පාප්ප/ගම්



# ක්‍රියාකාරකම



1. අරලිය මල් ඉරටුවට අමුණා ගැනීම හෝ සව් කඩදාසි මල් පෙති ඉරටුවල කෙළවරට තබා අලවා මලක් සකස් කර ගන්න.

2. කපා ගත් සව් කඩදාසි තීරු ඉරටුවල අලවන්න.

3. මේ ආකාරයට ඉරටු 20ක මල් සකස් කර ගන්න.

4. කඩදාසි තීරු අලවා ලී මිට අලංකාර කර ගන්න.

5. කෙසෙල් බඩ කැබැල්ල හෝ පැපොල් ගෙඩිය ලී මිටේ උල් කරන ලද පැත්තේ සවි කරන්න.

6. සකස් කරන ලද මල් ඉරටු කෙසෙල් බඩයේ හෝ පැපොල් ගෙඩියේ අලංකාර ලෙස සවි කරන්න.

7. ඔබේ මල් ගස ඔසවා ගෙන සාධු! සාධු! සාධු! කියමින් සිඟිති පෙරහැරේ ගමන් කරන්න.

# 13 පින්තාලියක් හදමු


තිසර :- අපි නිවාඩු කාලේ අනුරාධපුරේ
වන්දනාවේ ගියා.
වතුර පුරවපු ලොකු භාජනයක
"පින්තාලිය" කියා ලියා තිබුණා.
ඒකෙ තියෙන්නෙ වන්දනාවේ යන එන
අයට බොන්න වතුර කියලා අත්තම්මා
කිවුවා.

ගුරුතුමී :- ඔව් පුතේ, ඒ පින්තාලියක් !

නිපුන :- මොකක් ද ගුරු මෑණියනි,
පින්තාලිය කියන්නෙ?

ගුරුතුමී :- ඉස්සර කාලේ පයින් ගමන් යන අයට
පිපාසයට බොන්න අද වාගේ බීම වර්ග,
වතුර බෝතල් තිබුණේ නැහැ.
පින්වත් උදවිය ගමන් යන අයට බොන්න
තැනින් තැන ලොකු භාජනවලට වතුර
පුරවලා තැබුවා.

වන්දනාවේ යන අය පින්තාලියෙන් වතුර බීලා, පිපාසය නිවා ගත්තා; පින්තාලිය හැදූ අයටත් පින් දුන්නා. පිපාසයෙන් සිටින කෙනෙකුට වතුර ටිකක් හරි දෙන්න ලැබීම ලොකු පින්කමක් පුතේ.




තරණි :- ගුරු මෑණියනි, අපිත් පින්තාලියක් හදමු.

නිපුන :- අපි හැමෝ ම බොන්න වතුර බෝතලයක් ගෙදරින් ගේනවනේ. ඒක නිසා අපට පින්තාලියකින් වැඩක් නැහැ නේද?

තිසර :- එහෙනම් අපි කුරුල්ලන්ට වතුර බොන්න
පින්තාලියක් හදමු.

ගුරුතුමී :- ඒක නම් හොඳ අදහසක්.
අපි කුරුලු ලෑල්ලට කිට්ටුවෙන් ම
පින්තාලිය හදමු.

සඳමාලි :- කුරුල්ලෝ වතුර බීලා නාගෙනත් යාවි.

ගුරුතුමී :- හැබැයි, පුතාලා හැමදාම පින්තාලිය පිරිසිදු
කරන්නත් අමතක කරන්න එපා.



## ක්‍රියාකාරකම

1. වැඩිහිටි උදවු ඇති ව නිවසේ දී පින්තාලියක් සකස් කරන්න.

2. පින්තාලියේ වතුර බොන කුරුල්ලෝ චිත්‍රයට නගන්න.

3. පින්තාලිය ගැන ඔබට සිතෙන දේ ලියන්න.

# 14 අනාථපිණ්ඩික සිටුතුමා

සුදත්ත සිටුතුමා සැවැත් නුවර සිටි ධනවත් සිටුවරයෙක්.

එතුමා "බුද්ධ" යන වචනය අසා මහත් සතුටට පත් වුණා;
තෙරුවන් සරණ ගියා.

දිනපතා සිටු මැදුරේ දී මහා සංඝරත්නයට දානය පූජා කළා;
දුගීමගී යාචකයන්ටත් දන් දුන්නා.

මේ නිසා ම සුදත්ත සිටුතුමා අනේපිඬු සිටුතුමා නමින් ප්‍රසිද්ධ වුණා.

බුදු සසුනේ අග්‍ර දායක තනතුර හිමි වුණෙත් අනේපිඬු සිටුතුමාටයි.

බුදුබණ අසා සෝවන් වුණු අනේපිඬු සිටුතුමා
මිය ගොස් දිව්‍යලෝකයේ දෙව් කෙනෙක් වෙලා ඉපදුණා.

# 15 අනුබුදු මිහිඳු හිමි

අපේ රටට බුදු දහම රැගෙන වැඩම කළේ
මිහිඳු මහරහතන් වහන්සේයි.
උන් වහන්සේගේ පියා
ධර්මාශෝක රජතුමා.
මව දේවී බිසව.
සංඝමිත්තා තෙරණිය
උන් වහන්සේගේ සොහොයුරියයි.

එකල ලංකාව පාලනය කළ
දේවානම්පිය තිස්ස රජතුමා
බුදු දහම වැලඳ ගත්තා.



මිහිඳු මහරහතන් වහන්සේ
රජතුමාට උපදෙස් දුන්නා.
රජතුමා වෙහෙර විහාර ඉදි කළා.
මිහිඳු මහරහතන් වහන්සේ
ලංකාවේ අය මහණ කළා;
කාන්තාවන් මහණ කරන්න
සංඝමිත්තා තෙරණිය වැඩමවා ගත්තා.

සංඝමිත්තා තෙරණිය
ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ ද
රැගෙන ලංකාවට වැඩම කළා.
අනුබුදු මිහිඳු මහරහතන්
වහන්සේගේ වැඩමවීම නිසා
රට පුරා බුදු දහම පැතිරුණා.



# 16 සාලිකේදාර ජාතකය

සරුසාර ව වැඩී තිබුණු වී කෑමට
ගිරවු රංචුවක්
හැමදාම කුඹුරට එන්න
පුරුදු ව සිටියා.



ගොවියා අත්පුඩි ගැහුවා,
කෑ ගැහුවා, නමුත්
ගිරවු රංචුවේ පැමිණීම නතර වුණේ නෑ.

ගිරවු රංචුවේ සිටිය නායක ගිරවා
හැම දිනක ම
වී කරල් කිහිපයක් රැගෙන යනවා
ගොවියා දැක්කා.

දවසක් ගොවියා උගුලක් අටවා
නායක ගිරවා අල්ලා ගත්තා.



"අනෙක් ගිරවු වී කාලා යනවා
නුඹ විතරක් ඇයි
අරගෙන යන්නේ?"
ගොවියා ඇහුවා.

"අනේ ! ගොවිරාල
මගේ අම්මායි තාත්තායි
දෙන්නා ම වයසයි.
ඒ අයට කෑම සොයා ගන්න අමාරුයි.
ඒ නිසයි අරගෙන යන්නේ,"
නායක ගිරවා කිවුවා.


"බොහොම හොඳයි.
හෙටත් එන්න.
ඕන තරමක් වී කරල් අරන් යන්න.
අම්මාටයි තාත්තාටයි සැලකීම
උතුම් දෙයක්."

අපිත් අම්මාටයි තාත්තාටයි සලකමු.

# 17 අපේ ගෙදර පින්කමට සූදානම්

"පුතේ, ලබන මාසෙ අපේ ගෙදර දානමය පින්කමක් කරමු ද?"
අත්තම්මා තාත්තාගෙන් ඇහුවා.

"ඒක නම් හොඳ අදහසක් අම්මේ,
ඉස්සෙල්ලා ම ලොකු හාමුදුරුවන්ට
ආරාධනා කරලා දිනයක් වෙන් කර ගන්න,"
තාත්තා කිවුවා.



අත්තම්මාත් මමත් **දැහැත්, ගිලන්පස**
අරගෙන පන්සලට ගියා. ලොකු හාමුදුරුවන්ට
දානයට **ආරාධනා** කළා.
"ලබන මාසෙ විසි වෙනි දාට පින්කම තියාගනිමු"
ලොකු හාමුදුරුවෝ යෝජනා කළා;
දානමය පින්කමේ වැඩ කටයුතු ගැන
උපදෙස් දුන්නා.

පින්කමට කලින් අපි ගෙදර හා වත්ත පිටිය
පිරිසිදු කළා.

ලොකු අම්මා **අටපිරිකර** හා **සෙසු පිරිකර** පූජා කරන්න
භාර ගත්තා.

'හැමෝ ම පින්කමට සම්මාදම් වෙන්න' අත්තම්මා
කිවුවා.

හැමෝ ම එකතු වෙලා දානයට අවශ්‍ය දේවල් සූදානම්
කළා.

වැඩිහිටි අය ධාතු කරඬුව තැන්පත්
කරන ස්ථානය පිළියෙල කළා;
සුදු ඇතිරිලි යොදා ස්වාමීන් වහන්සේලාගේ ආසන
සකස් කළා.

ස්වාමීන් වහන්සේලාගේ **පා ධෝවනයට** අවශ්‍ය දේවල් ලොකු තාත්තා සූදානම් කළා.



මමත් දැහැත් වට්ටිය පිළියෙල කරන්න උදවු වුණා.

දැන් අපේ ගෙදර දානමය පින්කමට සූදානම්.

# ක්‍රියාකාරකම



✿ හරි නම් ✓ ලකුණ ද වැරැදි නම් ✗ ලකුණ ද වරහන තුළ යොදන්න.

- දානයට ආරාධනා කරන්න තාත්තා විහාරයට ගියා. ( )
- පින්කමට විසි වෙනි දා දිනය ලොකු හාමුදුරුවෝ යෝජනා කළා. ( )
- සුදු ඇතිරිලි දමා ආසන පිළියෙල කළා. ( )
- මමත් දැහැත් වට්ටිය පිළියෙල කරන්න උදවු වුණා. ( )
- පා ධෝවනයට අවශ්‍ය දේවල් පිළියෙල කළේ ලොකු තාත්තා ය. ( )

# 18 පින්කම දා අපේ ගෙදර

ගෙදර හැමෝ ම සංවර සුදු ඇඳුමින් සැරසුණා. අත්තම්මා දානයට සූදානම් කළ දේවල් මුලින් ම බුද්ධ පූජාවට බෙදා වෙන් කළා.

අපි ස්වාමීන් වහන්සේලා වැඩම කරවාගෙන ඒමට විහාරයට යන විට බුද්ධ පූජාවත් රැගෙන ගියා.



හේවිසි හඬ මැද්දේ තාත්තා මුතු කුඩය යටින් ධාතු කරඬුව හිස මත තබාගෙන පැමිණියා.

ඊට පසුපසින් ස්වාමීන් වහන්සේලා පෙළියට වැඩම කළා.

සාධු නාද මැද්දේ තාත්තා ධාතු කරඬුව තැන්පත් කළා. අයියා ස්වාමීන් වහන්සේලාගේ පා ධෝවනය කළා. මම පා පිසදැමුවා.

සියලු දෙනා ස්වාමීන් වහන්සේලාට වැන්දා.

බුද්ධ පූජාව තැන්පත් කළා. ලොකු හාමුදුරුවෝ පිරිස පන්සිල් සමාදන් කරවා බුද්ධ පූජාව පැවැත්වූවා.

ඉන් පසු අපි ස්වාමීන් වහන්සේලාට,


පැන් පූජා කළා.

දානය පිළිගැන්වූවා.


පිරිකර පූජා කළා.

හාමුදුරුවෝ දානමය පින්කමක වටිනාකම පැහැදිලි කරමින් ධර්ම දේශනා කළා.

පැන් වැඩීමෙන් පසුව ස්වාමීන් වහන්සේලා
පිරිත් දේශනා කර අපට
සෙත් පැතුවා.



පින්කම හොඳින් නිමා කිරීම ගැන අපි කවුරුත් සතුටු වුණා.



## ක්‍රියාකාරකම

❁ හිස් තැනට සුදුසු වචනය තෝරා ලියන්න.

1. තාත්තා මුතු කුඩය යටින් ______________ හිස මත තබාගෙන පැමිණියා.

2. අයියා ස්වාමීන් වහන්සේලාගේ පා ______________ කළා.

3. ලොකු හාමුදුරුවෝ ______________ පැවැත්වූවා.

4. ස්වාමීන් වහන්සේලා ______________ දේශනා කළා.

5. දානය පිළිගැන්වීමෙන් පසු ______________ පූජා කළා.

(බුද්ධ පූජාව / ධාතු කරඬුව / ධෝවනය / පිරිත් / පිරිකර)

# 19 කම්මැළි නැති ළමයි

මල්ලී :- අයියා මොනවා ද උදේ පාන්දර මිදුලේ කරන්නේ?

අයියා :- මම මල් පැළවලට වතුර දානවා. මල්ලීත් එන්න.



මල්ලී :- අනේ ! මට කම්මැළියි අයියේ.

අයියා :- හොඳ ළමයි කම්මැළි වෙන්නේ නැහැ.
උදෙන් ම අවදි වෙලා ගොඩක් වැඩ
කරනවා.

මල්ලී :- උදෙන් ම අවදි වෙලා පාඩම් කරන්න
කියලා ගුරුතුමීත් අපට කිවුවා.

අයියා :- ඔව් මල්ලී. කම්මැළි නැතුව උදෙන් අවදි
වුණා ම අපේ ශරීරය නීරෝගී වෙනවා.
උදෙන් ම පාඩම් කළා ම අපට හොඳට
මතක හිටිනවා.

මල්ලී :- උදෙන් ම පාසලට එන ළමයින්ට ගුරුතුමී
ආදරෙයි කිවුවා.

අයියා :- උදෙන් අවදි වුණා ම පමා නො වී
පාසලට යන්නත් පුළුවන්. එතකොට තමයි
ගුරුතුමීත් අපට ආදරේ වෙන්නේ.

මල්ලී :- මීට පස්සේ මමත් අයියා වාගේ කම්මැළි
නැති ව උදෙන් අවදි වෙලා පාඩම් කරනවා.

අයියා :- එන්න, අපි දෙන්නා ම මේ අඹ පැළය හිටවමු.

මල්ලී :- හොඳයි අයියේ. මම වතුරත් අරගෙන එන්නම්.

අයියා :- හොඳ මල්ලී.

## ක්‍රියාකාරකම



✿ මෙම වැකි හරි ද? වැරැදි ද?

1. උදෙන් ම අවදි වුණා ම ගොඩක් වැඩ කරන්න පුළුවන්. (     )
2. උදෙන් ම පාඩම් කළා ම මතක හිටිනවා. (     )
3. හොඳ ළමයි කම්මැළි වෙනවා. (     )
4. කම්මැළි නැති ළමයින්ට ගුරුතුමී ආදරෙයි. (     )
5. උදෙන් ම පාසලට යන්නේ කම්මැළි නැති හොඳ ළමයි. (     )

# 20 අපි තාත්තාට අම්මාට උදවු කරමු


උදාර :- මම පොත් බෑගයට පොත් පැන්සල් දාලා පාසලට ගෙනියන්න සූදානම් කර ගන්නවා.
අම්මා කරන වැඩවලට මම උදවු කරනවා.

සංඛ :- මම පාසල ඇරී ගෙදර ආවා ම පොත් බෑග්, ඇඳුම් ඒ මේ අත විසි කරලා දාන්නේ නැහැ.
අම්මා කියන විදියට ඒවා නිසි තැන තියලා අම්මාට උදවු කරනවා.

තමාදි :- අම්මා උයන කොට මම ලූනු සුද්ද කරලා දෙනවා.

යශෝමා :- මම මගේ පිඟාන, කෝප්පය සෝදා ගන්නවා. අම්මාට කුස්සිය අස් කරන්නත් උදවු කරනවා.

මුදිතා :- මම ගේ අතු ගානවා. මේස, පුටු පිළිවෙළකට තියා ගන්න අම්මාට උදවු කරනවා.



සුජානි :- අම්මා ඇඳුම් හෝදන කොට මම පොඩි ඇඳුම්වල සබන් ගාලා දෙනවා. රෙදි වැලට ඇඳුම් දාන්න අම්මාට උදවු කරනවා.

අමිල :- එළවළු කොරටුවෙන් එළවළු කඩන්නත් ඒවා ගෙදර ගේන්නත් මම තාත්තාට උදවු කරනවා.

කසුන් :- මම තාත්තාට කුඹුරට කෑම ගිහින් දෙනවා. කුඹුරේ වල් පැළ ගලවලා දාන්නත් උදවු කරනවා.



ජනක :- තාත්තා ලී බඩු හදන කොට මම ලී කුඩු අස් කරනවා. වඩු මඩුව පිරිසිදු කරන්නත් තාත්තාට උදවු කරනවා.

## ක්‍රියාකාරකම



- ඔබ නිවසේ දී තාත්තාට, අම්මාට උදවු කළ අවස්ථා දෙකක් ලියන්න.

1.

2.

# 21 කනට මිහිරි වචන

නාමලී උදෙන් ම පන්තියට ආවා.
මුදිතා පන්තියේ හිටියා.
"ආයුබෝවන්, තෙරුවන් සරණයි," මුදිතා කිවුවා.
"ආයුබෝවන්, තෙරුවන් සරණයි," නාමලී කිවුවා.

නාමලී අකුරු ලියන්න බලන කොට පැන්සල තිබුණේ නැහැ.
නාමලී බය වුණා; ඇස්වලට කඳුළු ආවා.
මුදිතා ඉක්මනට නාමලීට පැන්සලක් දුන්නා.



"බොහෝ ම ස්තුතියි. ඔයාට ගොඩක් පින්,"
නාමලී කිවුවා.
මුදිතා සතුටින් හිනා වුණා.

නාමලීත් මුදිතාත් ළඟට සංඛ ආවා.
"මට මේ ගණන හදන්න අමාරුයි.
කරුණාකරලා මේ ගණන හදන හැටි මට කියලා දෙන්න," සංඛ මුදිතාට කිවුවා.
මුදිතා ගණන හදන හැටි සංඛට කියා දුන්නා.
"ඔයාට බොහෝ ම ස්තුතියි," සංඛ කිවුවා.

සංඛ එතැනින් යන කොට අත වැදිලා කසුන්ගේ පැන්සල බිම වැටුණා.
සංඛ පැන්සල ඇහිඳලා කසුන්ගේ මේසය උඩ තිබ්බා.
"සමාවෙන්න කසුන්, තරහ නැහැනේ?"
සංඛ ඇහුවා.
"අනේ නෑ සංඛ, බොහෝ ම ස්තුතියි" කසුන් කිවුවා.

## ක්‍රියාකාරකම



- මේ වචන පන්තියේ ප්‍රදර්ශනය කරමු.

තෙරුවන් සරණයි

ආයුබෝවන්

බොහෝ ම ස්තුතියි


කරුණාකරලා

සමාවෙන්න

# 22 ආදරයෙන් පරිසරය රැක ගනිමු

පරිසරය ලස්සන කරන දිය ඇල්ලෙන් සීතල වතුර ගලා හැලෙනවා. සිසිල් සුළඟින් සුවය ලැබෙනවා.

ඇළ, දොළ, ගංගා වාගේ ම ගස්වැල්, මල්, පලතුරු, කුරුල්ලෝ, සිවුපා සත්තු පරිසරයට අයිති දේවල්.



කඳු, මුහුදු වාගේ ම අහස, පොළොව මේ හැම දේ ම පරිසරයට අයිතියි.

අපි මේ පරිසරය ආදරයෙන් රැක ගන්න ඕනෑ.
ගංගා, ඇළ, දොළ ආදියට කුණු දාන්න හොඳ නැහැ.
ජලය අපිරිසිදු කරන්න හොඳ නැහැ.

හිස් වතුර බෝතල්, කෑම දවටන, කඩදාසි ආදිය
හැම තැන ම විසි කරලා දාන්න හොඳ නැහැ.
කුණු නිසි විදියට බැහැර කරන්න ඕනෑ.
තැන් තැන්වල කෙළ ගසා
අපිරිසිදු කරන්නත් හොඳ නැහැ.

අපි ගස්වැල් වවන්න ඕනෑ;
ආරක්ෂා කරන්න ඕනෑ;
සත්ත්ව සම්පත රැක ගන්න ඕනෑ.


අපට සතුටින් ජීවත් වෙන්න පරිසරය උදවු කරනවා. පරිසරයට ආදරය කළා ම පරිසරයත් අපට ආදරය කරනවා.

## ක්‍රියාකාරකම



- ඔබ පන්තිභාර ගුරුතුමිය සමග එක් වී පාසලේ ඔබේ පන්තියට අදාළ කොටස පිරිසිදු කරන්න.

## පුහුණුවට



සුළඟ සිසිලසයි දිවිය රැකේ ලංකා
ජල බිඳු මිහිරියි ජීවය දෙයි ලංකා
පලතුරු රසවෙයි දිවි සුරකියි ලංකා
නෙත් සේ පණ සේ සුරකිමු අපි ලංකා

# 23 අන් සන්තකයක් ගන්න එපා

පන්සිල්වල දෙවන සිල්පදය
අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

ඒ සිල් පදයේ තේරුම
'මට නුදුන් දෙයක් සොර සිතින් ගැනීමෙන් වැළකෙමි'
කියන එකයි.

අපට අයිති නැති දෙයක්,
පාරෙ වැටිලා තිබුණත්
යම් තැනක අමතක වීමකින් තිබුණත්
ඒ දේ ගන්න හොඳ නැහැ.

ඒ වගේ ම අන් සතු දෙයක්
සොරකම් කරන්නත් හොඳ නැහැ.

අද අපි ඒ ගැන කියවෙන කවියක් ඉගෙන ගනිමු.



යන්තම් පොඩි බඩුවකුත් පුතේ
අන් සන්තකයක් ගන්න එපා
මගේ දෙයක් වත් නුදුන් එකක්
මට නොකියා අරගන්න එපා

(යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම නාහිමි)

# කුරුල්ලන්ගෙන් ලස්සන වන පරිසරය

අහස පුරා ම කුරුල්ලෝ !

ඈත මෑත ඉඳලා ඇවිත්, නිදහසේ ඒ මේ අත ඉගිලෙනවා.

කුරුල්ලන්ට මහන්සි දැනුණා ම සෙවණ තියෙන ගස්වල වහනවා.



පලතුරු කන්න, මල් පැණි බොන්න,
මහන්සි නිවාගන්න තමයි කුරුල්ලෝ
ගස්වලට එන්නෙ.
මල් පිරුණු ගස්වලට පාට පාට ලස්සන
කුරුල්ලෝ ආවා ම තවත් ලස්සන වෙනවා.

කුරුල්ලො අහසේ පියාඹමින්
අහස ම ලස්සන කරති පුතේ
ගහක ඇවිත් වහලා සිටිමින්
ගහමත් ලස්සන කරති පුතේ

(යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම නාහිමි)



## ක්‍රියාකාරකම

1. ගසකට පාට පාට කුරුලු රංචුවක් ඇවිත්......
   චිත්‍රයට නගන්න.

# 24 හොඳ ගුණදම් පුරුදු වෙමු

ගුරුන් ගුණ මහත ය
දෙගුරුන් ගුණ ද මහත ය
මෛත්‍රී ගුණ මහත ය
සැලකූ අය හට මහත් සැපත ය

අපේ ගුරුවරුන්ගේ ගුණ බොහෝ ය.
ඒ වගේ ම අපේ දෙමවුපියන්ගේ ගුණ ද බොහෝ ය.
ගුරුවරුන්ට හා දෙමවුපියන්ට සලකන අය බොහෝ දියුණුවට පත් වේ.



| | |
|---|---|
| ගෙදොර සැම | කටයුතු |
| හොඳින් සලකා | කළ යුතු |
| කීවට නො කළ | යුතු |
| කරනු සතුටින් බලා | කටයුතු |

නිවසේ සැම දෙයක් ම හොඳින් සොයා බලා කරන්නට අප පුරුදු විය යුතු ය.



## ක්‍රියාකාරකම

1. පන්තියේ සැම එක් වී සාරධර්ම ගසක් නිර්මාණය කර ප්‍රදර්ශනය කරන්න.

2. එහි හොඳ ගුණදම් ඔබේ ජීවිතයට එක් කර ගන්න.

# 25 පිළිවෙළකට දවස ගෙවමු



උදෑසනින් අවදි වෙමු
දත කට මැද මුව දොවමු
සුපිපි සුවඳ මල් නෙළමු
අපි සැම තෙරුවන් වඳිමු

උදයේ ආහාර ගනිමු
දෙමාපියන් පා වඳිමු
වේලාසන පිටත් වෙමු
පාසල වෙත පිය නගමු

ගුරුවරුනට කීකරු වෙමු
හොඳට අකුරු ඉගෙන ගනිමු
යහළුවන්ගෙ සිත් නොරිදමු
අපි සැම හොඳ ළමයින් වෙමු


පාසල නිම වී ආ විට
ඇඳුම් වනා පිළිවෙළකට
ඇඟ සෝදා පිරිසිදුවට
සැරසෙමු දහවල් කෑමට

එක දිගට ම වැඩ කළාට
විවේකයක් ඕන අපට
සිත් නිවනා වාදනයට
යොදමු සවන් අපි මඳකට

ගුරුතුමී දුන් ගෙදර වැඩත්
ආසාවෙන් කරමු අපිත්
ගේ දොර කටයුතුවලටත්
උදවු කරමු අපි සැවොමත්

සවසට මුව කට සෝදමු
මල් දෝතක් නෙළා ගනිමු
මලින් තෙලින් බුදුන් පුදමු
සැම දෙන වෙත මෙත පතුරමු

සැම එක් වී අහර ගනිමු
දත් මැදලා කට සෝදමු
මා පියන්ගෙ පා නමදිමු
සුව නින්දක් ලබා ගනිමු



## ක්‍රියාකාරකම


1. ඔබත් දින චරියාවකට කටයුතු කිරීමට පුරුදු වෙන්න.

2. ඔබ දවස ගත කළ ආකාරය අභ්‍යාස පොතේ ලියන්න.

# 26 සිල් ගනිමු පින් පුරමු

එදා අපේ සිල් සමාදන් වෙන දවසයි.
අපි උදෙන් ම අවදි වුණා.
මුහුණ සෝදා පිරිසිදු වුණා.
සිල් ඇඳුම් ඇඳ ගත්තා;
වට්ටියට මල් නෙළා ගත්තා.
පාසලට ගියා.

අපේ හාමුදුරුවෝ වැඩියා.
සාධු! සාධු! සාධු!
හාමුදුරුවෝ අප සිල් සමාදන් කරවූවා.
අපි කවුරුත් සිල් සමාදන් වුණා.



හාමුදුරුවෝ අපට බණ කථා
කියා දුන්නා.

කවුරුත් පෙළ ගැසී
බුද්ධ පූජාව කළා.
සාධු! සාධු! සාධු!

අපි දවල් දානය වැළඳුවේ හරිම සංවර ව.
වළඳන ගමන් කතා කළේ නෑ;
හිනාවුණේ නෑ; විහිළු කළේ නෑ.
හවසත් බණ ඇහුවා, භාවනා කළා.
බුද්ධ වන්දනාවෙන් පසු සිල් පවාරණය කළා,
ගෙදර ගියේ හරිම සතුටින්.

අපි අම්මටයි තාත්තටයි දණ ගසා වැන්දා.
"බුදු සරණයි ! පුතේ" අම්මයි තාත්තයි අපට
ආශීර්වාද කළා.

# 27 මෙත් සිත පතුරමු

අපි කැමැතියි, භාවනා කරන්න.
අපි භාවනා කරන්න පුරුදු වෙමු.



සියලු දෙනා ම හිස කෙළින් තබා ගනිමු
සිරුර කෙළින් තබා ගනිමු
ඇස් දෙක පියා ගනිමු
හොඳට හුස්මක් ගෙන පිට කරමු
සිරුර සැහැල්ලු කර ගනිමු

මගේ සිත පිරිසිදු ය, පිරිසිදු ය, පිරිසිදු ය
මගේ සිත සන්සුන් ය, සන්සුන් ය, සන්සුන් ය
මගේ සිත තැන්පත් ය, තැන්පත් ය, තැන්පත් ය
මගේ සිත පිරිසිදු ය, සන්සුන් ය, තැන්පත් ය

මම නිදුක් වෙම්වා!
නීරෝගී වෙම්වා!
සුවපත් වෙම්වා! සුවපත් වෙම්වා! සුවපත් වෙම්වා!

සියලු සත්ත්වයෝ
නිදුක් වෙත්වා!
නීරෝගී වෙත්වා!
සුවපත් වෙත්වා! සුවපත් වෙත්වා! සුවපත් වෙත්වා!




**පුහුණුවට**

සවස බුද්ධ වන්දනාවෙන් පසු ව මෛත්‍රී භාවනාව වඩන්න පුහුණු වන්න.

# 28 යහපත් මිතුරු ඇසුර

සමන් මිදුලට වෙලා දුකෙන් බලා ගෙන හිටියා.
අද සෙල්ලම් කරන්න යාළුවෝ ආවේ නැහැ.
සමන්ට පාළුයි. ඒ වේලාවේ ලොකු තාත්තා ගෙදරට ආවා.
සමන්ගේ හිතේ තියෙන දුක ලොකු තාත්තාට තේරුණා.
ලොකු තාත්තා සමන් ළඟින් වාඩි කරවා ගත්තා.
"පුතා දන්නවද නරක යාළුවෝ ගැන?"
"නැහැ ලොකු තාත්තේ.?"



"බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා නභජේ පාපකේ මිත්තේ කියලා. ඒ කියන්නේ නරක මිතුරන් ආශ්‍රය කරන්න හොඳ නැහැ කියලා"

"කවුද ලොකු තාත්තේ නරක යාළුවෝ?"

"හාමුදුරුවන්ට, දෙමවුපියන්ට, ගුරුවරුන්ට ගරු නොකරන, අකීකරු අය තමයි නරක යාළුවෝ.
සතුන්ට හිංසා කරන, බොරු කියන, හොරකම් කරන අයත් නරක අය තමයි."

"එතකොට හොඳ යාළුවෝ කියන්නේ?"

"තෙරුවන් වඳින පුදන, හාමුදුරුවන්ට, දෙමවුපියන්ට, ගුරුවරුන්ට ගරු කරන, වඳින පුදන අය හොඳ යාළුවෝ."

"හොඳට ඉගෙන ගන්න අයත් හොඳ අය ද ලොකු තාත්තේ?"

"ඔව් පුතා. හොඳට ඉගෙන ගන්නවා වාගේ ම හොඳ ගතිගුණත් ඒ අය ළඟ තියෙන්න ඕනෑ.
එහෙම අය තමයි අපි ආශ්‍රය කරන්න ඕනෑ."


"හොඳයි, ලොකු තාත්තේ," සමන් ලොකු තාත්තාට දණ ගහලා වැන්දා.

"හොඳ පුතා," ලොකු තාත්තා සමන්ගේ හිස අත ගෑවා.



## ක්‍රියාකාරකම

* හොඳ මිතුරකුගේ ගතිගුණ තුනක් ලියන්න.



## පුහුණුවට

න භජේ පාපකේ මිත්තේ
න භජේ පුරිසාධමේ
භජේථ මිත්තේ කල්‍යාණේ
භජේථ පුරිසුත්තමේ

පාපී මිතුරන් ඇත් කරන්නේ
පහත් අයගෙනුත් වෙන් වී යන්නේ
යහපත් මිතුරන් ඇසුරු කරන්නේ
උත්තම මිතුරන් ළං කර ගන්නේ

# 29 නීරෝගී වෙමු

රෝහලට ගිය වේලාවේ බිත්තියේ ලොකු අකුරෙන් "ආරෝග්‍ය පරමාලාභා" කියා ලියා තිබුණා.

එම පාඨයේ තේරුම නීරෝගීකම උතුම් ම ලාභය බවයි.

නීරෝගී ව ඉන්න
අපි වස විස නැති ආහාර කෑමට ගන්න ඕනෑ.
පිරිසිදු වතුර බොන්න ඕනෑ.



අපට වත්තේ තියෙන එළවළුවලින්,
පලා කොළවලින් හොඳ ආහාර ලබා ගන්න පුළුවන්.
උදෙන් ම අවදි වෙලා ගස්වැල්වලට සාත්තු
කරන කොට ලැබෙන පිරිසිදු වාතය නිසා
අපි නීරෝගී වෙනවා;
අපට ව්‍යායාමයකුත් ලැබෙනවා.



එක එක පාට කලවම් කරලා තියෙන පැණි බීම
වර්ග බීලා, අපිරිසිදුවට තියෙන කෑම වර්ග කාලා
හුඟක් ළමයි ලෙඩ වෙනවා.

අපි දිනපතා නාලා, ඇඳුම් පැලඳුම් පිරිසිදු ව තියා ගන්න ඕනෑ.
අපේ හිතත් පිරිසිදු ව සතුටින් තියා ගන්න ඕනෑ.

තමන්ට වාගේ ම අනෙක් අයටත් මෛත්‍රී කරලා හිත සතුටින් ඉන්න අපට පුළුවන්.
එතකොට ශරීරයයි හිතයි පිරිසිදු වෙනවා.
ලෙඩ නැති වෙලා අපි නීරෝගී වෙනවා.



## ක්‍රියාකාරකම

❀ හරි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. නීරෝගී ව සිටීම (සතුටක්/දුකක්).
2. අපි (අපිරිසිදු/පිරිසිදු) කෑම බීම ගන්න ඕනෑ.
3. අපි (පිරිසිදු/අපිරිසිදු) ඇඳුම් අඳින්න ඕනෑ.
4. අපි නිතර ම සිත (සතුටින්/අසතුටින්) ඉන්න ඕනෑ.



# පුහුණුවට

ආරෝග්‍ය පරමාලාභා
සන්තුට්ඨී පරමං ධනං
විස්සාස පරමා ඤාති
නිබ්බාන පරමං සුඛං

උතුම් ම ලාභය නිරෝගිකම වේ
සතුටින් පිරි බව ධන සම්පත වේ
නෑදෑකම නම් විශ්වාසය වේ
නිවන් සුවය නම් උතුම් සුවය වේ

# 30 ථූපාරාම දාගැබ නමදිමු



අනුරාධපුරයේ සෑදූ පළමුවෙනි දාගැබ ථූපාරාමයයි.

මෙහි බුදුරජාණන් වහන්සේගේ දකුණු අකු ධාතුන් වහන්සේ නිදන් කර තිබෙනවා.

මෙහි ථූපයක් මෙන් ම ආරාමයක් ද තිබූ නිසා ථූපාරාමය නමින් හැඳින්වෙනවා.

දේවානම්පිය තිස්ස රජතුමා ථූපාරාමය කරවූවා.

මෙය සොළොස්මස්ථානයට අයත් වෙනවා.

අපි මල් පහන් පුදා, සැදැහැ සිතින් ථූපාරාම වෙහෙර වහන්සේ නමදිමු.

සාධු! සාධු!! සාධු!!!



## ක්‍රියාකාරකම

✿ පිළිතුරු හරි ද වැරැදි ද?

1. ථූපාරාමයේ නිදන් කර තිබෙන්නේ බුදුරජාණන් වහන්සේගේ දකුණු අකු ධාතූන් වහන්සේයි. (     )

2. අනුරාධපුරයේ සෑදූ පළමු වැනි චෛත්‍යය ථූපාරාමයයි. (     )

3. දුටුගැමුණු රජතුමා ථූපාරාමය කරවූවා. (     )

# 31 සමාධි පිළිම වහන්සේ



අනුරාධපුරයේ සමාධි පිළිම වහන්සේ වැඩ සිටිනවා.


දේවානම්පිය තිස්ස රජතුමා මෙම පිළිම වහන්සේ කරවන ලදැයි සැලකෙනවා.

බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය සමාධි පිළිම වහන්සේගෙන් පෙනෙනවා.

අපේ මුතුන් මිත්තන් විසින් ගලින් කර ඇති
මේ නිර්මාණය දුටුවා ම අපට පුදුම හිතෙනවා.

බුදුරජාණන් වහන්සේ සිහි කර
අපි සමාධි පිළිම වහන්සේට
මල්, පහන් පුදා වඳිමු.

සාධු! සාධු!! සාධු!!!



## පුහුණුවට

අනුරාපුරයට එළිය ගෙනෙනවා
සෑම දෙනා හට සැනසුම දෙනවා
මහ කරුණාවේ ගුණය පෙනෙනවා
සමාධි පිළිමය අපි නමදිනවා

## පෙළ පොත සම්පාදනයේ දී ඉවහල් කර ගත් දර්ශනය

දෙවන ශ්‍රේණියට පිවිසෙන දරුවන්ට බුදු දහම තම ජීවිතයට සම්බන්ධ කොට, ප්‍රියජනක ලෙස ඉගැන්වීම සුදුසු ය. පෙළ පොත භාවිතය මෙන් ම ආගමික වතාවත් හා බැඳුණු ප්‍රායෝගික ක්‍රියාකාරකම් මගින් ද ඉගැන්වීම් ක්‍රමය පෝෂණය කළ හැකි වේ. මෙම පෙළපොතෙහි පාඩම් ගොඩ නැගී ඇත්තේ ආගමික ක්‍රියාකාරකමකට පෙර හෝ පසු ව හෝ සමගාමී ව හෝ යොදා ගත හැකි ආකාරයට ය.

**1. නිති පන්සිල් රකිමු**
නිරන්තරයෙන් පන්සිල් ආරක්ෂා වන සේ තම ජීවිතය හැඩ ගස්වා ගැනීමට සිසුන් යොමු කිරීම මෙයින් අපේක්ෂිත ය.

**2. පින්බිමට යන බොදු දරුවෝ**
පන්සල ගෞරවනීය ස්ථානයක් බවත්, එහි දී සංවර ව හැසිරීම අත්‍යවශ්‍ය බවත් සිසුන්ට අවබෝධ කර දීම මෙහි අරමුණ වේ.

**3. හොඳ දරුවෝ වෙමු**
යහපත්, හොඳ දරුවන් වැඩිහිටියන්ට කීකරු ව තම ජීවිතය සකස් කර ගන්නා බව අවබෝධ කර දීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**4. මහාමායා දේවිය දුටු සිහිනය**
පින්වත් පුතකු වූ බෝසත් උපත සිදු වීමේ පෙර නිමිති මායා දේවිය දුටු සිහිනය තුළින් සංකේතවත් වන බව සිසුන්ට වටහා දීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ.

**5. බෝසත් උපත**
බෝසත් කුමරුගේ ඉපදීමත්, එය අවසන් ඉපදීම බව ගාථාවකින් ප්‍රකාශ කිරීමත් මෙම පාඩමෙන් අවධාරණය කෙරේ.

**6. පිය රජුගේ පළමු වැඳීම**
සුද්ධෝදන රජු තම පුතුට වැඳීම තුළින් අසිරිමත් පුද්ගලයකු ලොවට බිහි වී ඇති බව පැහැදිලි කිරීම මෙයින් අපේක්ෂිත ය.

**7. කුමරුට නම් තැබීම**
ලොවට මහත් අර්ථයක් සිදු කරන්නා යන අර්ථය ඇති 'සිද්ධාර්ථ' යන නම පිළිබඳ ව අවධානය යොමු කරමින් සිසුන්ට කරුණු පැහැදිලි කිරීම මෙහි අරමුණ වේ.

**8. මට්ටකුණ්ඩලී දෙව් පුත්**
බුදුන් වහන්සේගේ මහා කරුණාවත්, ඉතා සුළු පිනක් වුව ද යහපත් සිතින් කිරීමෙන් දෙව්ලොව ඉපදීමට පවා වාසනාව ලැබෙන බවත් මෙම පාඩමෙන් පැහැදිලි කිරීම අපේක්ෂිත ය.

**9. සතුන්ට කරුණාව දක්වමු**
සතුන්ටත් දුක වේදනාව දැනෙන බව පැහැදිලි කොට සිසුන් සත්ත්ව හිංසාවෙන් වැළකීමට යොමු කිරීම මෙහි අරමුණ වේ.

**10. ගමේ විහාරෙට පෙරහැර එනවා**
පෙරහැරක විවිධ අංග හඳුන්වා දෙමින් මෙය පද්‍ය නිර්මාණයක් ලෙස අගය කිරීම මෙම පාඩමේ අරමුණ වේ.

**11. බොදු ගී**
අසෝක කොළඹගේ මහතා රචනා කළ, විශාරද නන්දා මාලිනී මහත්මිය ගායනා කරන මෙම ගීතයෙන් සිසුන් තුළ බොදු හැඟීම් ජනිත කිරීම අරමුණ වේ.

**12. අපේ පෙරහැරට මල් ගසක් හදමු**
අවශ්‍ය ද්‍රව්‍ය සූදානම් කර ගෙන සිසුන් ප්‍රායෝගික ව මෙම ක්‍රියාකාරකමෙහි යෙදවීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**13. පින්තාලියක් හදමු**
පානීය ජලය රැස් කර තබන පින්තාලිය හඳුන්වා දී ඒ කෙරෙහි සිසු අවධානය යොමු කිරීම මෙහි අරමුණ වේ.

**14. අනාථපිණ්ඩික සිටුතුමා**
නිරතුරු ව ම දන් දී පින් සිදු කර ගත් සුදත්ත සිටුතුමාගේ පුණ්‍ය ක්‍රියා කෙරෙහි සිසුන් යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ.

**15. අනුබුදු මිහිඳු හිමි**
ලක්දිවට බුදු සසුන රැගෙන වැඩම කළ මිහිඳු මහ රහතන් වහන්සේ පිළිබඳ වත්, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ රැගෙන වැඩම කළ සංඝමිත්තා රහත් තෙරණින් වහන්සේ පිළිබඳ වත් මෙම පාඩමෙන් අවධාරණය කෙරේ.

**16. සාලිකේදාර ජාතකය**
මෙම ජාතක කථාවේ දී බෝසත් චරිතය කෙරෙහි අවධානය යොමු කොට මවුපිය උපස්ථානයේ වැදගත්කම අවධාරණය කිරීම අරමුණ වේ.

**17. අපේ ගෙදර පින්කමට සූදානම්**

දානයක් දීමට පෙර නිවැසියන් පන්සල හා සම්බන්ධ ව ඊට සූදානම් වන ආකාරය පැහැදිලි කර දීම මෙම පාඩමේ අරමුණ වේ.

**18. පින්කම දා අපේ ගෙදර**

නිවසේ සියලු දෙනා ම විවිධ ආකාරයෙන් සහභාගි වී දානමය පින්කම සිදු කළ යුතු බව අවබෝධ කිරීම මෙහි අපේක්ෂාවයි.

**19. කම්මැළි නැති ළමයි**

අලස නො වී උදෙන් අවදි වීමේ වැදගත්කමත්, ඉන් ලැබෙන නීරෝගී සුවයත් පිළිබඳව අවධානය යොමු කිරීම මෙයින් අපේක්ෂිත ය.

**20. අපි තාත්තාට අම්මාට උදවු කරමු**

දරුවන් තමන්ට හැකි ආකාරයට තම දෙමවුපියන්ට උදවු කිරීමේ වටිනාකම අවධාරණය කිරීම මෙම පාඩමේ අරමුණ වේ.

**21. කනට මිහිරි වචන**

සුහදතාව වර්ධනය වන සේ, අවස්ථානුකූල ව යෙදිය හැකි වදන් සිසු අවධානයට යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**22. ආදරයෙන් පරිසරය රැක ගනිමු**

අපගේ ජීවිත රකින පරිසරය ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම අවබෝධ කර දීම මෙම පාඩමේ අරමුණ වේ.

**23. අන් සන්තකයක් ගන්න එපා**

සොරකම් කිරීම වැරැදි ක්‍රියාවක් බව පැහැදිලි කර අන් සතු දේ ගැනීමෙන් වැළකීමේ අදහස සිසු මනස තුළ තහවුරු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**24. හොඳ ගුණදම් පුරුදු වෙමු**

දෙමවුපියන්ට, ගුරුවරුන්ට සලකමින් තමන්ට හැකි සෑම දෙයක් ම සොයා බලා කිරීමට පුරුදු වීම තුළින් යහගුණ සුරැකෙන බව මින් අවධාරණය කෙරේ.

**25. පිළිවෙළකට දවස ගෙවමු**

බොදු වත්පිළිවෙත් අනුව තම ජීවිතය හසුරුවා ගැනීමේ වැදගත්කම සිසුන්ට අවබෝධ කරවීම මෙයින් අපේක්ෂිත ය.

**26. සිල් ගනිමු පින් පුරමු**

සිල් සමාදන් වී සිල් සුරැකීම බොදු දරුවකුගේ හොඳ ලක්ෂණයක් බව අවධාරණය කර ඒ සඳහා සිසුන් යොමු කිරීම මෙම පාඩමේ අරමුණ වේ.

**27. මෙත් සිත පතුරමු**

භාවනා කිරීමේ අරමුණ පහදා දී සිසුන් භාවනාවට යොමු කිරීමේ වැදගත්කම මෙම පාඩමෙන් අවධාරණය කෙරේ.

**28. යහපත් මිතුරු ඇසුර**

සුවිශේෂී බුදු වදන් ඉගෙන ගනිමින් ධර්මයට අනුව තම ජීවිතය සකස් කර ගැනීමට සිසුන් යොමු කිරීම මෙයින් අපේක්ෂිත ය.

**29. නීරෝගී වෙමු**

කායික හා මානසික වශයෙන් නීරෝගී වීමේ වැදගත්කම දක්වන සුවිශේෂී බුදු වදන කෙරෙහි මෙහි දී අවධානය යොමු කෙරේ.

**30. ථූපාරාම දාගැබ නමදිමු**

ලංකාවේ පළමු දාගැබ ථූපාරාමය ලෙස හඳුන්වා දී, සර්වඥ ධාතු නිදන් කර ඇති මෙම ආරාමය වන්දනා කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම අපේක්ෂිත ය.

**31. සමාධි පිළිම වහන්සේ**

බුදුන් වහන්සේගේ මහා කරුණා ගුණය පිළිබිඹු වන මෙම පිළිම වහන්සේ පිළිබඳ ව අවධානය යොමු කරමින් වන්දනා කිරීමට සිසුන් යොමු කිරීම මෙම පාඩමේ අරමුණ වේ.